# 2015

# කාර්යසාධන වාර්තාව

බුද්ධශාසන අමාත්‍යාංශය

# දැක්ම

බෞද්ධ සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් බිහිකිරීමේ ප්‍රමුඛතම පහසුකරන්නා බවට පත්වීම.

# මෙහෙවර

බෞද්ධ ආගමික සිද්ධස්ථාන කේන්ද්‍ර කරගනිමින්, බෞද්ධාගමික ඉගැන්වීම් මත පදනම් වෙමින් සියලු පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය ඇතිව ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කර, ක්‍රියාත්මක කිරීම තුළින් යහපත් ජීවන රටාවක් සහිත ගුණගරුක සමාජයක් බිහිකිරීමට උරදීම.

# පටුන

## මාතෘකාව


පිවිසුම

අමාත්‍යාංශය පිහිටුවීමේ පසුබිම හා අරමුණු

**1. බුද්ධශාසන අමාත්‍යාංශය**

1.1. අමාත්‍යංශ කාර්යභාරය

1.2. උපාය මාර්ග

1.3. බුද්ධශාසන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක

1.4. 2015 වර්ෂික ප්‍රතිපාදන

**2. 2015 ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්**

2.1 බොදු දිනපොත් මුද්‍රණය කිරිම හා බෙදා හැරිම

2.2 අඩු පහසුකම් ප්‍රදේශවල විහාරස්ථාන වැඩිදියුණු කිරීම

2.3 2600 සම්බුද්ධ ජයන්ති නිමිත්තෙන් දහම් පාසල් 2600ක් සංවර්ධනය කිරිම

2.4 නේපාලයේ ලුම්බිණි නුවර ස්ථාපිත දුටුගැමුණු විශ්‍රාම ශාලාව ප්‍රතිසංස්කරණය කිරිම

2.5 විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම

2.6 ඉන්දියානු නව දිල්ලි ශ්‍රී ලංකා විශ්‍රාම ශාලාව

2.7 අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය

2.8 මහවැලි මහාසෑය - කොත්මලේ

2.9 පූජා භූමි සංවර්ධනය

**3 ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්**

3.1 පුණ්‍යග්‍රාම වැඩසටහන

3.2 මතට තිත ව්‍යාපෘතිය

3.3 වෙනත් භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

**4 බුද්ධශාසන අරමුදල**

4.1 අනුමත ව්‍යාපෘති සඳහා වූ වර්තමාන ප්‍රගතිය

# පිවිසුම

***"සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් "***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් මෙරටේ බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන අතර, බුද්ධශාසනය ආරක්ෂා කිරීම, පෝෂණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සලසන්නා සේම සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම ද අවධාරණය කර ඇත. මෙම අදහසට අනුකූලව මෛත්‍රී පාලනයක් ස්ථාවර රටක් ප්‍රතිපත්ති ප්‍රකාශයේ විසිපස් වන පිටුවේ "සියලු ආගම් වල ජනතාවට තමන්ගේ ආගමික ඇදහිලි සඳහා ඇති නිදහස සහතික කරන." බව ප්‍රකාශ කර ඇත. මෙම අරමුණ සාක්ෂාත් කරලීම පිණිස සුදුසු ව්‍යාපෘතීන් සමාජගත කිරීම හා සමස්ත ශ්‍රී ලාංකේය සමාජයම ආවරණය වන අයුරින් යහගුණ වර්ධනයෙහි ලා ඉවහල් වන වැඩසටහන් දියත් කිරීම බුද්ධශාසන අමාත්‍යාංශයේ වගකීම බවට පත් ව ඇත. මේ අනුව බුද්ධශාසන අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ අතුරින් විශේෂ වූ රාජ්‍ය ආයතනයක් වන්නේ නිරායාසයෙනි.

සමාජ සාරධර්ම වලින් පිරිපුන් ගුණගරුක දියුණු පුරවැසියන් සහිත දේශයක් බිහිකිරීම වෙනුවෙන් කළයුතු දෑ කල් නොයවා ඉටුකල යුතු බව අතිගරු ජනාධිපතිතුමා විසින් නිරන්තරයෙන් අවධාරණය කරනු ලබන්නේ ආධ්‍යාත්මික වශයෙන් සංවර්ධිත පුරවැසියන් සහිත දේශයක් ගොඩනැගීමේ අවශ්‍යතාවය මේ යුගයේ දී වඩ වඩාත් තදින් දැනෙන බැවිනි. ජාතීන් අතර එකමුතුකම සංහිඳියාව ප්‍රවර්ධනය කරන්නා වූ ආකල්ප ප්‍රචලිත කිරීම උදෙසා ප්‍රජාවට ආගමික නායකත්වය සැපයීමත් සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය නිරන්තර මෙහෙවරක යෙදී සිටී.

ඒ අනුව බුද්ධශාසන අමාත්‍යාංශය, ඒ යටතේ ඇති බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කරමින් මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම උදෙසා සුවිශාල කාර්යභාර්යයක් ඉටුකරයි.

# අමාත්‍යාංශය පිහිටුවීමේ පසුබිම හා අරමුණු

"ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය."

එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙන් හා 14 වන ව්‍යස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලුම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර, බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය.

(*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව*)

# 1. බුද්ධශාසන අමාත්‍යාංශය

## 1.1. අමාත්‍යාංශ කාර්යභාරය

- සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධශාසන අරමුදල, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය, යන ව්‍යවස්ථාපිත ආයතනයන්හි ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම.
- බුදු දහම සුරක්ෂිත කොට පෝෂණය කිරීම ප්‍රවර්ධනය උදෙසා යෝග්‍ය වැඩසටහන් හා ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම.
- බුදු දහම සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම.
- පූජා භූමි සැළසුම්කරණය හා සංවර්ධනය කිරීම.
- අන්තර්ජාතික වශයෙන් ථෙරවාද බුදුදහම ප්‍රචාරය කිරීම සඳහා කටයුතු කිරීම.
- උත්තරීතර අනුශාසක මණ්ඩලයේ අවශ්‍යතා ඉටුකිරීම.
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධශාසන අරමුදල, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයට පැවරී ඇති අනෙකුත් සියළුම විෂයන්ට අදාළ කටයුතු
- බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, බුද්ධශාසන අරමුදල, ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය යන ආයතනයන් අධීක්ෂණය කිරීම.

## 1.2. උපාය මාර්ග

**ඉහත කාර්යයභාරයන් කඩිනමින් සාක්ෂාත් කර ගැනිම උදෙසා පහත සඳහන් උපාය මාර්ග අනුගමනය කරන ලදී.**

- වෘත්ත්වය හා ප්‍රායෝගික ගැටළු අවම කර ගැනීම සඳහා පූජ්‍ය පක්ෂය හා මහජනතාව සමඟ මුහුණට මුහුණලා සිදු කරනු ලබන සාකච්ඡා පැවැත්වීම හා නිර්දේශ ලබා ගැනීම.
- ආයතන නවීකරණය කිරීම හා අභ්‍යන්තර පාලන උපායමාර්ග භාවිතය.
- Ppub (රාජ්‍ය සහයෝගිතා) හා ppp (රාජ්‍ය පෞද්ගලික සහයෝගිතාව) සඳහා අවශ්‍යතාවයන් අනුව පිවිසීම.
- කළමනාකරණයේ දී අවශ්‍ය වන තොරතුරු නිර්මාණය කිරීම සඳහා දත්ත ලබාගැනීම හා අවශ්‍ය

තොරතුරු පදනම් කරගෙන තොරතුරු තාක්ෂණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීම.

- නව කළමනාකරණ ක්‍රමවේද භාවිතය.
- යහපත් හා තෘප්තිමත් මහජන සම්බන්ධතාවයක් ඇති කිරීම සඳහා ක්‍රමවේද හඳුන්වාදීම.
- දේශිය ඥානය හා ශ්‍රී ලාංකිය උරුම සංරක්ෂණය සඳහා දෘෂ්‍ය සාක්ෂි නිර්මාණය කිරීම හා වර්තමානය සංරක්ෂණය කිරීම සඳහා ශ්‍රව්‍ය, හා දෘෂ්‍ය හා ලිඛිත මාධ්‍ය භාවිතය.

## 1.3. බුද්ධශාසන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්ය සාධක දර්ශක

- බෞද්ධාගමික සිද්ධස්ථාන හා පුද්ගලයා අතර පවතින සබඳතාවය තර කර ගැනීම සඳහා ඊට නව හැඩතලයක් ලබා දෙමින් ධනාත්මක ආකල්ප වර්ධනය කරන උසස් පුද්ගල පෞරුෂයක් සහිත දහම් අධ්‍යාපන ජාලය ප්‍රතිනිර්මාණය කිරීම.
- සියලු බෞද්ධ විහාරස්ථාන තොරතුරු තාක්ෂණයෙන් බල ගන්වා බහුසේවා සපයන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම.
- බෞද්ධාගමික සිද්ධස්ථාන පද්ධතිය දෙස් විදෙස් සංචාරකයින්ගෙන් ආකර්ෂණය කල හැකි මහජන ප්‍රසාදය දිනූ ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කර ගැනීම.
- සම්ප්‍රදාය සංරක්ෂණය කර නූතන පරපුර වෙත රැගෙන යන ද්වාරයක් ලෙස විධිමත් භෞතිකමය සංවර්ධනයක් සහිත බෞද්ධාගමික මධ්‍යස්ථාන ප්‍රතිනිර්මාණය කිරීම.
- බෞද්ධ ආගම බෞද්ධ දර්ශනය ජාත්‍යන්තරව ව්‍යාප්ත කිරීම.
- සදාචාර සම්පන්න දැහැමි දැයක්, දැහැමි රටක් නිර්මාණය කිරීම.

### අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ හා කාර්ය භාරය

බෞද්ධ සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් බිහිකිරිමේ ප්‍රමුඛතාම පහසුකරන්නා යන දැක්ම ලඟා කරගැනීම අරභයා ඉටු කලයුතු කාර්ය භාරය ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රධාන අංශ 08කින් බුද්ධශාසන අමාත්‍යාංශය සමන්විත වේ.

එනම්,

1) පාලන අංශය
2) සංවර්ධන අංශය
3) ගිණුම් අංශය
4) පූජාභූමි සංවර්ධන අංශය
5) බුද්ධ ශාසන අරමුදල
6) සමස්ථ ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලය

පාලන අංශය

බුද්ධශාසන අමාත්‍යාංශයේ දැක්ම හා මෙහෙවර ලඟා කර ගැනිම උදෙසා අමාත්‍යාංශය සතු සමස්ත මානව සම්පත් හා භෞතික සම්පත් කළමණාකරනය හා අධික්ෂණය කිරීමේ කාර්ය භාරය පාලන අංශය මඟින් සිදු කෙරේ. අතිරේක ලේකම් (පාලන හා මුදල්) යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මඟින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

1. අමාත්‍යාංශයේ සියළුම පරිපාලන කටයුතු.
2. මාණ්ඩලික නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ පෞද්ලික ලිපිගොනු නඩත්තු කිරීම.
3. අමාත්‍යාංශය සතු වාහන පරිපාලනය.
4. අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සියළුම නඩත්තු හා පරිපාලනය.
5. අමාත්‍ය කාර්ය මණ්ඩලය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල වලත් සියළුම පරිපාලන කටයුතු හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීම.
6. අමාත්‍යාංශයේ පැවැත්වෙන උත්සව පිළිබඳ කටයුතු කිරීම.
7. බෞද්ධ කටයුතු දෙපාර්තුමේන්තුවේ පරිපාලන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
8. අමාත්‍යාංශයේ සියළුම රාජකාරී දුරකථන බිල්පත් නිරවුල් කිරීම.
9. අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ වරිපනම් හා විදුලි බිල්පත් නිරවුල් කිරීම.
10. අමාත්‍යාංශයේ පවිත්‍රතා කටයුතු හා ආරක්ෂක අංශය පිළිබඳව කටයුතු කිරීම.
11. අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම, සියළුම පනත් සම්බන්ධව කටයුතු කිරීම.
12. වීසා අංශයේ කටයුතු
    - විදේශයන්හි සිට ආගමික කටයුතු සඳහා පූජ්‍ය පක්ෂය හා ගිහි පිරිස් සඳහා පූජ්‍ය පක්ෂය හා ගිහි පිරිස් සඳහා වීසා නිර්දේශ ලිපි නිකුත් කිරීම.(පැමිණීමේ වීසා, වාස වීසා ලබා දීම හා දීර්ඝ කිරීම සඳහා නිර්දේශ)
    - මෙරට පිට රට වසන ස්වාමින්වහන්සේලා වීසා නිර්දේශ ලිපි නිකුත් කිරීම.
    - දඹදිව වන්දනා සංවිධාන ලියාපදිංචි කිරීම.
    - දඹදිව වන්දනා සඳහා වීසා නිර්දේශ නිකුත් කිරීම.
    - දඹදිව වන්දනා සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම.
13. කාර්ය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය.

**සංවර්ධන අංශය**

රාජ්‍ය අයවැය ලේඛනයෙන් බෞද්ධාගමේ පුනර්ජීවනය හා සංවර්ධනය උදෙසා ලබා දෙන මුල්‍ය ප්‍රතිපාදනයන් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව සංවර්ධන වැඩ සටහන්වල ආයෝජනය කිරීම තුලින් සාරධර්ම සපිරි ගුණ ගරුක සමාජයක් බිහිකිරීම සඳහා සැලසුම් කිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම හා

පසුවිපරම් කිරීම සංවර්ධන අංශයේ ප්‍රධාන අරමුණයි. අතිරේක ලේකම් (සංවර්ධන) යටතේ ක්‍රියාත්මක වන මෙම අංශය මඟින් ඉහත අරමුණු ලඟාකර කර ගැනීම සඳහා පහත සඳහන් කාර්ය භාරයන් ඉටු කරනු ලබයි .

1. අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කෙරෙන විවිධ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් පිළියෙල කිරීම හා අධීක්ෂණය කොට ක්‍රියාත්මක කිරීම.
2. වාර්ෂික සැලසුම් සකස් කිරීම.
3. අමාත්‍යාංශයේ හා අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රගති සමාලෝචන කටයුතු
4. අමාත්‍යාංශයේ සැලසුම් හා සංවර්ධන විෂයට අදාලව අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සැකසීම හා ඒවායේ තීරණ ක්‍රියාත්මක කිරීමට අදාල කටයුතු .
5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන සියළුම දේශීය/ විදේශීය ඉදිකිරීම් ව්‍යාපෘතින්ට අදාල රාජකාරී කටයුතු සම්බන්ධීකරණය මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම.
6. ග්‍රන්ථ මුද්‍රණය හා වාර්ෂික දිනපොත් සැකසීම.
7. අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ දෙපාර්තමේන්තු හා ආයතනයන්හි සංවර්ධන විෂයට අදාල කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
8. අමාත්‍යාංශය හා බාහිර ආයතන ප්‍රමුඛත්වයෙන් ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය.
9. අමාත්‍යාංශ තොරතුරු අංශය යාවත්කාලීන කොට පවත්වා ගැනීම.
10. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය ක්‍රියාත්මක කර යාවත්කාලීනව පවත්වාගෙන යෑම.
11. අමාත්‍යාංශය මඟින් ආගමික සහජීවන සඳහා කෙරෙන විවිධ වැඩසටහන් සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම.
12. අමාත්‍යාංශයේ මාධ්‍ය කටයුතු සම්බන්ධීකරණය.

## පූජාභූමි සංවර්ධන අංශය

පුරාවිද්‍යාත්මක සාධක සහිත ඓතිහාසික වටිනාකම් වලින් යුක්ත වූ, ප්‍රාදේශීය වශයෙන් එහි එක් එක් පූජනීය ඓතිහාසික ස්ථානයක් විසින් සිදුකරනු ලබන ආගමික හා සමාජීය සේවාවන් පදනම් කරගෙන හඳුනා ගනු ලැබූ ස්ථාන, 1946 අංක 15 දරණ ගෘහ හා ග්‍රාම නිර්මාණ පනත යටතේ ගැසට් මඟින් ප්‍රකාශයට පත්කොට වෙන් කොට දැක් වූ, පූජා භූමි සංවර්ධනය කිරීම මෙම අංශයෙන් සිදුවේ.

ඒ අනුව ආගමික වැදගත්කම, පුරා විද්‍යාත්මක හා පාරිසරික වැදගත්කම ඓතිහාසික වැදගත්කම, සංස්කෘතික වැදගත්කම, ආර්ථික හා සමාජීය යන කරුණු සැලකිල්ලට ගනිමින් පූජනීය ස්ථාන සංවර්ධනය සඳහා මූලාධාර සැපයීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

### බුද්ධශාසන අරමුදල

බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම හා සම්පාදනය කිරීමේ පරමාර්ථයෙන් බුද්ධශාසන අරමුදල 1990 අංක 35 දරන බුද්ධ ශාසන පනතේ විධිවිධාන යටතේ පිහිටුවා

ඇත. දේශීය වුවද විදේශීය වුවද කවර හෝ ප්‍රභවයකින් ලැබෙන අරමුදල් බුද්ධ ශාසනයේ ආරක්ෂාව තහවුරු කිරීම සහ එය පෝෂණය කිරීම උදෙසා ඉතාමත් යෝග්‍ය යැයි සැලකෙන ආකාරයට ආයෝජනය මෙහි කාර්ය භාරය වේ. මෙම අරමුදලේ පරිපාලන හා කළමනාකරණය පාලන මණ්ඩලයට පැවරී ඇත.

**බුද්ධශාසන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය**

**පිහිටීම-** බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය (දහම් පාය) අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.

**වෙබ් අඩවිය -** www. Mbra.gov.lk

**විද්‍යුත් තැපෑල -**

**දුරකථන අංක - 011 – 2307674**

**ෆැක්ස් අංකය - 011 -2307406**

<u>ගරු අමාත්‍යතුමාගේ කාර්යාලය</u>

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක |
|---|---|---|---|
| ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා (බුද්ධශාසන අමාත්‍ය) | 011-2303285 | 011-2303275 | 601 |
| රිචඩ් තනිප්පුලිආරච්චි මහතා (පෞද්ගලික ලේකම්) | 011-5979999 | 011-597999 | 602 |
| ආර්. එම්. තිලක් කුමාර රත්නායක (මාධ්‍ය ලේකම්) | 011-2300511 | 011-2300511 | 605 |
| අශෝක ප්‍රනාන්දු මහතා (සම්බන්ධීකරණ ලේකම්) | 011-2303270 | 011-2303270 | 606 |
| ප්‍රේමලාල් ඇල්විටිගල මහතා (සම්බන්ධීකරණ ලේකම්) | 011-2303283 | 011-2303283 | 604 |
| කේ.ඒ. ජේ. එස්. කුරුප්පු මහතා (මහජන සම්බන්ධතා නිලධාරී) | 011-2303275 | 011-2303275 | 608 |

**ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්යාලය**

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක |
|---|---|---|---|
| ගරු එච්. ආර් සාරථී දුෂ්මන්ත මිත්‍රපාල මැතිතුමා (බුද්ධශාසන | 0112303297<br>036-2266705 | | |


| | | | |
|---|---|---|---|
| නියෝජ්‍ය අමාත්‍ය) | 0773724634 | | |
| දිල්රුවන් රාජපක්ෂ මහතා (පෞද්ගලික ලේකම්) | 077-7888885 | | |
| ඒ.පී.විජය පතිරණ මහතා (සම්බන්ධීකරණ ලේකම්) | 072-5883338 | | |
| අසංක වර්ණ රණතුංග මහතා<br>(සම්බන්ධීකරණ ලේකම්) | 077-1685695 | | |

ලේකම් කාර්යාලය

| තනතුරු නාමය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | දිගු අංක |
|---|---|---|---|
| වසන්ත ඒකනායක මහතා ලේකම් | 011-2307430 | 011-2307406 | 400 |
| ජේ. ඒ.ඒ. එන් කන්නගගර මිය අතිරේක ලේකම් (පාලන) | 011-2307690 | 011-2307688 | 300 |
| ආර්. පී. ඩබ්. ගුණවර්ධන මිය. අතිරේක ලේකම් (සංවර්ධන) | 011-2307403 | 011-2300513 | 402 |
| ඩී. එච්. ඩබ්. ආර්. පී. රණවන මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | 0113119876 | | 304 |
| බී.ඒ. ප්‍රේමසිංහ මයා, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධන) | 011-2307693 | 011-2307405 | 406 |
| අධක්ෂ (පූජා භූමි සංවර්ධන) | 011-2303294 | | 207 |
| ආර්.එම්.ඩී.ඩී.රාජපක්ෂ මයා (ප්‍රධාන ගණකාධිකාරී) | 0112307673 | | 301 |
| ජී. එන්. මුණවීර මිය, (ප්‍රධාන අභ්‍යන්තර විගණක) | 011-2307699 | | 212 |

| | | | |
|---|---|---|---|
| ගණකාධිකාරී | 011-2307398 | | 303 |
| ආර්. ඒ. එන් ප්‍රියදර්ශනී මිය සහකාර අධක්ෂ (සැලසුම්) | 011-5886666 | | 403 |
| එස්. බී. ඩී. නිකපිටිය මෙනවිය සහකාර ලේකම් (පාලන) | 011-2307689 | | 302 |
| ජේ. එම්. කේ. ඩී. ජයසේකර මයා සහකාර ලේකම් (සංවර්ධන) | 011-2307409 | | 407 |
| ඩී.එස්. සුනිල් සමරසිංහ මයා පරිපාලන නිලධාරී (වැ.බ.) | 011-2307402 | | 305 |
| මංගලා වාකිෂ්ඨ මිය ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් | 011-2307402 | | 410 |
| බුද්ධශාසන අරමුදල | 011-2679969 | | |
| රජයේ විගණන අංශය | 011-2307401 | | 205 |
| රජරට චාරිකා නිවාසය | 025-2226556 | | |
| තොරතුරු තාක්ෂණ අංශය | 011-3071801 | | 506 |
| ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ ඒකකය | 011-5769730 | | |

# අමාත්‍යාංශ සංවිධාන සටහන



# බුද්ධශාසන අමාත්‍යාංශයේ 2015.12.31 දිනට කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | අදාළ සේවය | ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 01 | ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 01 | 01 | - |
| 02 | අතිරේක ලේකම් (පාලන හා මුදල්) | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 01 | 01 | - |
| 03 | අතිරේක ලේකම් (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. | විශේෂ | 01 | 01 | - |
| 04 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | I | 04 | 02 | 02 |
| 05 | අධ්‍යක්ෂ (සංවර්ධන) | ශ්‍රී.ලං.ප.සේ. | I | 01 | - | 01 |
| 06 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | I | 01 | 01 | - |
| 07 | සහකාර ලේකම් | ශ්‍රී.ලං.ප.සේ. | III | 04 | 02 | 02 |
| 08 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ක්‍ර.සේ. | II/ III | 01 | 01 | - |
| 09 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ග.සේ. | II/ II, II/ I | 01 | 01 (වැ.බ.) | 01 |
| 10 | ගණකාධිකාරී (ප්‍රධාන අභ්‍යන්තර විගණක) | ශ්‍රී.ලං.ග.සේ. | I | 01 | 01 | - |
| 11 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේ. | අධිපන්තිය | 01 | 01 (වැ.බ.) | 01 |
| 12 | භාෂා පරිවර්තක | භා.ප.සේ | III | 01 | 01 | - |
| 13 | ලේකම්තුමන්ගේ සම්බන්ධීකරණ ලේකම් | තාවකාලික | | 01 | 01 | - |
| 14 | අයවැය සහකාර | ආශ්‍රිත සේවය | | 01 | - | 01 |
| 15 | තොරතුරු තාක්ෂණ සහකාර | ආශ්‍රිත සේවය | | 03 | 03 | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 16 | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | | 12 | 10 | 02 |
| 17 | සැලසුම් සහකාර | ආශ්‍රිත සේවය | | 01 | - | 01 |
| 18 | සංවර්ධන නිලධාරී | ඒකාබද්ධ සේවය | | 90 | 38 | 52 |
| 19 | තාක්ෂණ සහකාර | ශ්‍රී.ලං.තා.සේ. | | 01 | - | 01 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.ස.සේ. | I, II, III | 31 | 23 | 08 |
| 21 | පිළිගැනීමේ නිලධාරී | දෙපාර්තමේන්තුගත | | - | 01 | - |
| 22 | කැමරා ක්‍රියාකරු | තාවකාලික | | 01 | - | 01 |
| 23 | කැමරා වීඩියෝ ක්‍රියාකරු | තාවකාලික | | 01 | - | 01 |
| 24 | රියදුරු | ඒ.රි.සේ. | | 17 | 16 | 01 |
| 25 | කැමරා ක්‍රියාකරු සහකාර | තාවකාලික | | 01 | - | 01 |
| 26 | කාර්යාල සේවක සේවය | කා.සේ.සේ. | | 16 | 15 | 02 |
| **කුරුන්දන්කුලම විශ්‍රාම ශාලාව** | | | | | | |
| 27 | ස්ථාන භාරකරු | රා.කළ.ස.සේ. | I | 01 | - | 01 |
| 28 | අරක්කැමි | දෙපාර්තමේන්තුගත | | 01 | 01 | - |
| 29 | කම්කරු | දෙපාර්තමේන්තුගත | | 01 | 01 | - |
| 30 | සනීපාරක්ෂක කම්කරු | දෙපාර්තමේන්තුගත | | 01 | 01 | - |
| **එකතුව** | | | | | | |

# 2015 වාර්ෂික ප්‍රතිපාදන.

2015 වර්ෂයේ රාජ්‍ය අයවැය ලේඛනයෙන් බුද්ධශාසන අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ගේ සම්පූර්ණ මුදල රු.මි.832.28කි. මින් පුනරාවර්තන ප්‍රතිපාදනය රු.මි. 179.51 ක් වන අතර ප්‍රාග්ධන ප්‍රතිපාදනය රු. මි 652.77 කි. 2015.12.31 වන දින වන විට අමාත්‍යාංශයට වෙන් කරන ලද පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් රු.මි159.26 ක් වියදම් වී තිබූ අතර වෙන්කළ ප්‍රාග්ධන ප්‍රතිපාදනයන් ගෙන් රු.මි. 640.48 ක් වියදම් වී තිබුණි.

# 2. 2015 ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන්

## 2.1 බොදු දිනපොත මුද්‍රණය කිරීම හා බෙදා හැරීම.

විහාරවාසී භික්ෂූන් වහන්සේලාගේ භාවිතය සඳහා මෙම දිනපොත මුද්‍රණය කර බෙදා හරිනු ලැබේ. දැනට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක ත්‍රෛනිකායික තොරතුරු හා ඊට අනුබද්ධ සෙසු නිකාය පාර්ශව වල තොරතුරු මෙන්ම සමස්ත ලංකා ශාසනාරක්ෂක බල මණ්ඩලයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ තොරතුරු ආදී ස්වාමීන් වහන්සේලාට වැදගත් වන තොරතුරු ඇතුලත් කොට මෙම දිනපොත සකසා ඇත.

විහාරස්ථාන දිනපොතට සමගාමීව ඇමතුම් දිනපොත ද භික්ෂූන් වහන්සේලාට විශේෂිත අයුරින් සකස් කර මුද්‍රණය කරදෙනු ලැබේ. මෙම දින පොත් දෙක වෙනුවට බෞද්ධ විහාරස්ථාන වල ගෞරවනීය ස්වාමීන් වහන්සේලාට මහත්වූ ශාසනික මෙහෙවර ඉදිරියට කරගෙන යාම සඳහා ඉවහල් වන විහාරස්ථාන කාර්ය දර්ශකයක් 2016 වර්ෂයේ සිට නිර්මාණය කොට බෙදා හැරීමට කටයුතු යොදා ඇත.

| අනු අංකය | දිනපොත් වර්ගය | දිනපොත් සංඛ්‍යාව | වියදම (රු.මි.) |
|---|---|---|---|
| 01 | විහාරස්ථාන දිනපොත | 26500 | 5.6 |
| 02 | ඇමතුම් දිනපොත | 13500 | |
| එකතුව | | | |


## 2.2 අඩු පහසුකම් ප්‍රදේශවල විහාරස්ථාන වැඩි දියුණු කිරීම

අඩු පහසුකම් ප්‍රදේශවල ආගමික සිද්ධස්ථාන වැඩිදියුණු කිරීම හා ආගමික ප්‍රබෝධයක් ඇති කිරීම පසුබිම් කරගෙන බුද්ධ ශාසන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන මෙම සංවර්ධන වැඩසටහන මගින් භෞතික සංවර්ධන වැඩසටහන්වල ප්‍රතිඵල නිසි යාකාරව භුක්ති විඳීම සුරක්ෂිත කිරීමත් , අධ්‍යාත්මික වශයෙන් දියුණු යහපත් සමාජයක් ගොඩනැගීමත් මූලික අරමුණු කොට ගෙන ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩ සටහන දිස්ත්‍රික්ක ලේකම්වරුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ ප්‍රාදේශිය ලේකම්වරුන් විසින් ක්‍රියාවට නංවනු ලැබීය.

අඩු පහසුකම් ප්‍රදේශවල විහාරස්ථාන වැඩි දියුණු කිරීම සඳහා 2015 වර්ෂයේදී රුපියල් මිලියන 50.0 ක ප්‍රතිපාදන වෙන් වූ අතර 2015.12.31 දිනට විහාරස්ථාන සංවර්ධනය සඳහා රුපියල් මිලියන 50.00 ක් වියදම් වී ඇත.

| අනු අංකය | දිස්ත්‍රික්කය | විහාරස්ථාන සංඛ්‍යාව | ලබා දුන් ආධාර මුදල (රු.) |
|---|---|---|---|
| 01 | ගාල්ල | 38 | 5,150,000.00 |

| | | | |
|---|---|---|---|
| 02 | මාතර | 22 | 3,200,000.00 |
| 03 | හම්බන්තොට | 40 | 8,200,000.00 |
| 04 | රත්නපුර | 9 | 1,450,000.00 |
| 05 | පොළොන්නරුව | 63 | 8,750,000.00 |
| 06 | කුරුණෑගල | 15 | 3,450,000.00 |
| 07 | ගම්පහ | 13 | 3,050,000.00 |
| 08 | අනුරාධපුර | 7 | 3,250,000.00 |
| 09 | කළුතර | 7 | 1,700,000.00 |
| 10 | නුවරඑළිය | 2 | 450,000.00 |
| 11 | අම්පාර | 2 | 350,000.00 |
| 12 | මහනුවර | 7 | 1,400,000.00 |
| 13 | මොණරාගල | 10 | 1,810,220.00 |
| 14 | කෑගල්ල | 6 | 1,250,000.00 |
| 15 | බදුල්ල | 4 | 800,000.00 |
| 16 | පුත්තලම | 1 | 100,000.00 |
| 17 | ත්‍රිකුණාමලය | 1 | 250,000.00 |
| 18 | මාතලේ | 3 | 2,300,000.00 |
| 19 | කොළඹ | 3 | 3,250,000.00 |
| **එකතුව** | | **265** | **50,160,220.00** |



## 2.3 2600 සම්බුද්ධ ජයන්තිය නිමිත්තෙන් දහම් පාසල් 2600ක් සංවර්ධන වැඩසටහන

"සියළුම ආගම් වල ජනතාවට තමන්ගේ ආගමික ඇදහිලි සඳහා ඇති නිදහස සහතික කරන්නෙමි" යන මෛත්‍රී පාලන ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රමුඛ කර ගනිමින් දෙදහස් හයසිය වන සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් අවම පහසුකම් යටතේ පවත්වාගෙන යනු ලබන දහම් පාසල් ප්‍රතිසංවිධානය කිරීම කරනු ලබයි. ඒ අනුව 2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 90.00 ක් ප්‍රතිපාදන වෙන් වූ අතර එයින් 2015.12.31 වන දිනට රුපියල් මිලියන 90.00 ක් සංවර්ධන කටයුතු සඳහා වැය කර දිස්ත්‍රික්ක 17ක් පුරා ව්‍යාපෘති 853ක් ක්‍රියාත්මක කරන ලදී.

2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් අඩු පහසුකම් සහිත දහම් පාසල් සංවර්ධනය කිරීම දිස්ත්‍රික්ක මට්ටමින් ප්‍රගතිය

| අනු අංකය | දිස්ත්‍රික්කය | දහම් පාසල් ගණන | ලබා දුන් ආධාර මුදල (රු.) |
|---|---|---|---|
| 01 | කොළඹ | 29 | 3,700,000 |
| 02 | කළුතර | 44 | 5,700,000 |
| 03 | මහනුවර | 25 | 2,700,000 |
| 04 | ගම්පහ | 310 | 29,200,000 |
| 05 | රත්නපුර | 1 | 150,000 |
| 06 | ගාල්ල | 3 | 450,000 |
| 07 | පොළොන්නරුව | 92 | 11,950,000 |
| 08 | අනුරාධපුරය | 17 | 1,950,000 |
| 09 | කුරුණෑගල | 141 | 13,150,000 |
| 10 | පුත්තලම | 41 | 2,050,000 |
| 11 | කෑගල්ල | 18 | 1,900,000 |
| 12 | මඩකලපුව | 2 | 300,000 |
| 13 | අම්පාර | 4 | 400,000 |
| 14 | බදුල්ල | 53 | 7,250,000 |
| 15 | මොණරාගල | 3 | 350,000 |

| | | | |
|---|---|---|---|
| 16 | නුවරඑළිය | 66 | 7,000,000 |
| 17 | මාතලේ | 4 | 500,000 |
| **එකතුව** | | **853** | **88,700,000** |

## 2015 .12.31 වන දිනට භෞතික මූල්‍ය ප්‍රගතිය

| වැය ශීර්ෂය | 101-01-06-2502-7 |
|---|---|
| වැඩසටහන් ආරම්භය | 2012 |
| අමාත්‍ය මණ්ඩල තීරණය | 2011.04.27 |
| අරමුණු | 2600 සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් ඌණ සංවර්ධිත දහම් පාසැල් 2600 ක් සංවර්ධනය කිරීම |
| කාල සීමාව | 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා |

## මුදල් ප්‍රතිපාදන ලැබීම් හා වියදම් සාරාංශය 2012 – 2015 දක්වා

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි) |
|---|---|---|
| 2012 | 100.00 | 94.66 |
| 2013 | 70.00 | 70.05 |
| 2014 | 90.00 | 86.35 |
| 2015 | 90.00 | 90.00 |
| එකතුව | 350.00 | 341.06 |

## 2.4 නේපාලයේ ලුම්බිණි නුවර ස්ථාපිත දුටුගැමුණු විශ්‍රාම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම.



නේපාලයේ ලුම්බිණි නුවර සංවර්ධන කාර්යයන් හි දී ශ්‍රී ලංකා බෞද්ධ විශ්‍රාම ශාලාවක් ඉදිකිරීමේ අවශ්‍යතාවය මතු වූයෙන් 1989 වර්ෂයේ දී නේපාල ලුම්බිණි සංවර්ධන භාරය විසින් ශ්‍රී ලංකා රජයට ඒ සඳහා භූමි භාගයක් වෙන් කරන ලදි.

එවකට රජය විසින් මෙම භූමි භාගයේ විශ්‍රාම ශාලාවක් ඉදිකර එය ශ්‍රී ලංකා දුටුගැමුණු විශ්‍රාම ශාලාව නමින් 1992 වර්ෂයේ දී මහජනයාට විවෘත කරන ලදි.

1992 සිට 2002 වර්ෂය දක්වා නේපාලයේ සින්ධූර් සමාගම විසින් මෙහි පාලන කටයුතු සිදු කරන ලද අතර, විශ්‍රාම ශාලාව 2002 වර්ෂයේ දී ශ්‍රී ලංකා රජයට පවරා ගන්නා ලදි. විවිධ හේතූන් මත විශ්‍රාම ශාලාව මහජනතාව වෙත විවෘත නොවුන අතර 2012 වර්ෂය වන විට එය වල්වැදී තිබුණි. කාලයාගේ ඇවෑමෙන් වල් බිහි වූ විශ්‍රාම ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු 2012 වර්ෂයේ දී නැවත ආරම්භ කරන ලදි.



ශ්‍රී ලංකා විශ්‍රාම ශාලාව ප්‍රතිනිර්මාණය කිරීමෙන් පසු
ලුම්බිණිය , නේපාලය

2014 වර්ෂයේ නොවැම්බර් මස වන විට විශ්‍රාම ශාලාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මි 158.00 ප්‍රතිපාදන වෙන් කරන ලද අතර 2015. 12.31 වන දිනට රු.මි.18.7 මූල්‍ය ප්‍රගතියක් වාර්තා විය. 2015 අගෝස්තු මස සිට බුද්ධශාසන අමාත්‍යාංශයේ මෙහෙයුම හා අධීක්ෂණය යටතේ පාලනය වන අතර එහි ආදායමින් එහි නඩත්තු හා පරිපාලන කටයුතු ද පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

## 2.5 විද්‍යාලංකාර ජාත්‍යන්තර බෞද්ධ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම.



දෙස් විදෙස් භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිසට බෞද්ධ දර්ශනය පිළිබඳව අදහස් උදහස් හුවමාරු කර ගැනීමට අන්තර් ජාතික මට්ටමේ සම්මන්ත්‍රණ ශාලාවක අවශ්‍යතාවය සපුරනු වස්, ශ්‍රවනාගාර, රැස්වීම් ශාලා, භෝජනාගාර, ප්‍රදර්ශන ශාලා හා ප්‍රවේශන ශාලාවකින් යුත් අති නවීන සම්මන්ත්‍රණ ශාලාවක් ලෙස පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් පරිශ්‍රයේ මෙම ගොඩනැගිල්ල ඉදිකරමින් පවතී.

2014 වර්ෂයේ දී මෙම ගොඩනැගිල්ලේ V වන අදියරේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ අතර 2015.12.31 දිනට සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.මි.95ක් වියදම් කර ඇත.

| වැය ශීර්ෂය | 101-01-06-2502-10 |
|---|---|
| වැඩසටහන් ආරම්භය | 2005 |
| අමාත්‍ය මණ්ඩල තීරණය | 2005.10.06 - 2006.06.15<br>2007.09.06 - 2008.08.07<br>2012.07.23 - 2013.01.18 |
| අරමුණු | බෞද්ධ අධ්‍යාපනය සඳහා පුරෝගාමීවූවන්ට උපහාරයක් වශයෙන් ද, බෞද්ධ පුනර්ජීවනයක් සඳහා අවශ්‍ය සම්මන්ත්‍රණ ආදිය පැවැත්වීම. |
| මුළු ව්‍යාපෘති පිරිවැය | රු.මි.1350.00 |

## මුදල් ප්‍රතිපාදන ලැබීම් හා වියදම් සාරාංශය 2005 – 2015 දක්වා

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|
| **2005-2012** | **507.30** | **431.70** |
| **2013** | **90.00** | **50.00** |
| **2014** | **90.00** | **69.00** |
| **2015** | **95.00** | **95.00** |
| **එකතුව** | **782.30** | **645.70** |

***ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්***

1. අදියර - අත්තිකාරම් සඳහා - රු.මි. 133.6 (Building)
2. අදියර - අත්තිකාරම් සඳහා - රු.මි. 54.9 (Basement & Slab)
3. අදියර - වහලය තෙක් සම්පූර්ණ කිරීම - රු.මි.133.9
4. අදියර - උත්සව ශාලා ගොඩනැඟිලි - රු.මි. 110.00
5. අදියර - 2015 වර්ෂයේ ලැබුන රු.මි. 95.00 ක මුදල පූර්ව අත්තිකාරම් ලෙස ගෙවා ඇත.

## 2.6 නව දිල්ලි ශ්‍රී ලංකා විශ්‍රාම ශාලාව

**ආරම්භය**

හිටපු ඉන්දිය අග්‍රාමාත්‍ය ශ්‍රී ජවහර්ලාල් නේරු මැතිඳුන්ගේ පාලන කාලයේදී (1958) ශ්‍රී ලංකීය බෞද්ධ වන්දනා කරුවන්ගේ සුභසාධනය සඳහා ප්‍රධාන දුම්රිය ස්ථානයට යාබදව වර්ෂයකට රුපියලක බදු ක්‍රමය යටතේ ඉඩමක් වෙන් කර දෙන ලදී. එම ඉඩමේ 1960 දී ශ්‍රී ලංකා විශ්‍රාම ශාලාවේ ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**පාලනය**

1990 වසරේ ශ්‍රී ලංකා මහකොමසාරිස් ලෙස කටයුතු කළ මංගල මුණසිංහ මහතා විසින් ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් කරන ලද සංශෝධන හේතුවෙන් විශ්‍රාම ශාලාවේ ආදායමේ විශාල වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. ඒ අනුව නව ගොඩනැගිලි ඉදිකරමින් විශ්‍රාම ශාලාවේ පහසුකම් වැඩි දියුණු කළයුතු බවට තීරණය කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ එවකට සිටි ජනාධිපතිනිය විසින් ව්‍යාපෘතිය අනුමත කර විශ්‍රාම ශාලාවේ ඉදිකිරීම් නටයුතු ආරම්භ කරන ලදී.

මුලින් ඉදිකරන ලද විශ්‍රාම ශාලාවේ කළමණාකාරීත්වය මහාබෝධි සමාගම වෙත පවරා දුන්නද ඔවුන් විසින් නිරන්තරයෙන් කළමනාකරණයේ වෙනස්කම් සිදු කරන වන ලදී. 2001 වර්ෂයේදී නව ගොඩනැගිල්ල ඉදි කිරීමෙන් පසු මෙම විශ්‍රාම ශාලාව පවත්වාගෙන යාමේ වගකීම බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යංශය වෙත පැවරිණි. මෙම විශ්‍රාම ශාලාවේ පාලනය හෝටල් සංස්ථාව වෙත පැවරීම සඳහා කටයුතු කළද එය අසාර්ථක වීම හේතුවෙන් 2003 වසරේදී විශ්‍රාම ශාලාව පවත්වාගෙන යාමේ වගකීම නව දිල්ලියේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා වෙත පවරන ලදී.

**අධීක්ෂණය**

ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය, නව දිල්ලිය (දෙවන ලේකම්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කෙරේ) ගිණුම් කටයුතු විශ්‍රාම ශාලාවේ කළමණාකරු විසින් සිදු කරගෙන යන අතර ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය විසින් ගිණුම් පරීක්ෂා කිරිමේ කටයුතු සිදු කරනු ලබයි.


## 2.7 අනුරාධපුර කුරුන්දන්කුලම රජරට චාරිකා නිවාසය

විවිධ රාජකාරී කටයුතු සඳහා සහ අනුරාධපුර ඓතිහාසික පූජාභූමිය වන්දනා කිරීමට පැමිණෙන රාජ්‍ය නිලධාරීන්ට සහනදායී මිලට නවාතැන් පහසුකම් ලබාදීමේ අරමුණින් අනුරාධපුර මිහින්තලය ප්‍රධාන පාරේ කුරුන්දන්කුලම ප්‍රදේශයේ කාමර නවයකින් හා දේශන ශාලාවකින් සමන්විත කුරුන්දන්කුලම දෙමහල් විශ්‍රාම ශාලාව ඉදිකර ඇත. එමගින් 2015 වර්ෂය සඳහා ලැබූ ආදායම රුපියල් 449,718.78 වේ.

2015.12.31 දිනට රජරට චාරිකා විශ්‍රාම ශාලාවෙන් උපයා ඇති ආදායම් හා වියදම් තත්වය

| අනු අංකය | මාසය | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---|---|---|
| 01 | ජනවාරි | 21,670.00 | 27,115.67 |
| 02 | පෙබරවාරි | 43,960.00 | 28,622.17 |
| 03 | මාර්තු | 17,380.00 | 21,556.64 |
| 04 | අප්‍රේල් | 41,180.00 | 19,190.14 |
| 05 | මැයි | 11,110.00 | 42,396.10 |
| 06 | ජුනි | 37,730.00 | 33,238.89 |
| 07 | ජූලි | 31,030.00 | 31,690.95 |
| 08 | අගෝස්තු | 92,300.00 | 35,332.37 |
| 09 | සැප්තැම්බර් | 174,500.00 | 46,775.89 |
| 10 | ඔක්තෝබර් | 78,100.00 | 53,338.78 |
| 11 | නොවැම්බර් | 90,700.00 | 22,991.73 |
| 12 | දෙසැම්බර් | 117,900.00 | 35,037.71 |
| **එකතුව** | | **757,560.00** | **397,287.96** |

## 2.8 මහවැලි මහා සෑය - කොත්මලේ



මහවැලි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේ දී ඉවත් කිරීමට සිදු වූ බෞද්ධ විහාරස්ථාන 21 ක් වෙනුවට රුවන්වැලි මහා සෑයට පමණක් අඩි දෙකකින් උසින් අඩු කොත්මලේ මහවැලි මහා සෑය නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඉදි කිරීමේ ව්‍යාපෘතිය 1983.03.20 හිටපු මහවැලි සංවර්ධන අමාත්‍ය දිවංගත ගරු ගාමිණී දිසානායක මැතිතුමාගේ සංකල්පයකට අනුව ආරම්භ වී ඇත. අවසාන් අදියරේ පවත්නා මහවැලි මහා සෑයේ ඉදිකිරීම් කටයුතු මහවැලි සංස්කෘතික පදනම් භාරය මඟින් අවසන් කරවීම සඳහා බුද්ධශාසන අමාත්‍යාංශය යටතේ 2015 වර්ෂයේ දී මේ සඳහා රුපියල් මිලියන 28.0 ක් වැය කර ඇත.

| වැය ශීර්ෂය | 101-01-06-2502-06 |
|---|---|
| වැඩසටහන් ආරම්භය | 1983.03.20 |

| | |
|---|---|
| අමාත්‍ය මණ්ඩල තීරණය | 2012.03.28 |
| අරමුණු | මහවැලි ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීමේදී ඉවත් කිරීමට සිදුවූ බෞද්ධ විහාරස්ථාන 21 වෙනුවට මෙම සෑය ඉදිකර ඇත. |
| කාලසීමාව | 2013-2015 |
| වාර්ෂික ව්‍යාපෘති පිරිවැය | රු.මි.145.00 |

### මුදල් ප්‍රතිපාදන ලැබීම් හා වියදම් සාරාංශය 2013 – 2015 දක්වා

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|
| **2013** | **15.00** | **15.00** |
| **2014** | **28.00** | **23.00** |
| **2015** | **28.00** | **28.00** |
| **එකතුව** | **71.00** | **66.00** |

## 2.9 පූජා භූමි සංවර්ධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1933/3, 2015 සැප්තැම්බර් 21 වැනි සඳුදා ප්‍රසිද්ධ කරන ලද අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් කරන ලද නිවේදනය පරිදි බුද්ධශාසන අමාත්‍යවරයාට පැවරී ඇති පූජාභූමි සැලසුම්කරණය හා සංවර්ධන විෂය ප්‍රකාරව නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශයේ චිරාත්කාලීන සුරක්ෂිත බව සඳහා එම ප්‍රදේශය පූජාභූමියක් ලෙස ගැසට් මඟින් ප්‍රකාශයට පත් කෙරේ.

මෙහිලා පහත සඳහන් නිර්ණායකයන් සැලකිල්ලට ගනු ලැබේ.

- ජාතික මට්ටමෙන් විශේෂ වූ ද වැදගත් වූ ද පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුන් ලෙස අනුරාධපුරය, තිස්සමහාරාමය, මහියංගනය, කැළණිය, දඹුල්ල, ආදී පූජනීය ස්ථාන දැක්විය හැකිය)
- ප්‍රාදේශීය මට්ටමින් වැදගත් වූ පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුන් ලෙස ඇත්කඳ විහාරය, සමන් දේවාලය (රත්නපුර), බෙල්ලන්විල, ආදී පූජනීය ස්ථාන දැක්විය හැකිය.)
- පුරාවිද්‍යාත්මක සාධක සහිත ඓතිහාසික වටිනාකමැති පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුනක් ලෙස මාළිගාවිල, දෙල්ගමුව රජමහා විහාරය, රිදී විහාරය, නැදිගම්විල, දීඝවාපිය ආදී පූජනීය ස්ථාන දැක්විය හැකිය.)

- ප්‍රාදේශීය වශයෙන් ඒ ඒ පූජනීය ස්ථානයන් මඟින් සිදුකරනු ලබන සුවිශේෂ වූ ආගමික හා සමාජයීය සේවාවන් පදනම් කරගෙන විෂය භාර අමාත්‍යතුමා විසින් හඳුනා ගනු ලබන පූජනීය ස්ථාන (මේ සඳහා නිදසුන් ලෙස රංවල පහන දේවාලය (පුවක්පිටිය), සිරි වජිරාරාමය (බම්බලපිටිය), ශ්‍රී අභයාරාමය (නාරාහේන්පිට), පොකුණුවිට රජමහා විහාරය (හොරණ) ආදී පූජනීය ස්ථාන දැක්විය හැකිය.

ඒ අනුව ආගමික වැදගත්කම, ඓතිහාසික වැදගත්කම, පුරාවිද්‍යාත්මක වැදගත්කම, සංස්කෘතික වැදගත්කම, ගෘහ නිර්මාණ ශිල්පීය වැදගත්කම, පාරිසරික වැදගත්කම, ආර්ථික හා සමාජයීය වැදගත්කම යන කරුණු ද සැලකිල්ලට ගනිමින් පූජනීය ස්ථාන සංවර්ධනය කිරීම සඳහා මූල්‍යාධාර සපයනු ලැබේ. 2015 වර්ෂය සඳහා අනුමත ප්‍රතිපාදන රුපියල් මිලියන 138.0 ක් වන අතර 2015.12.31 දින වන විට මුළු මුදලම වියදම් කර ඇත.

| අනු අංකය | මුදල් ලබාදුන් ආයතනය | පූජාභූමියේ නම සංවර්ධන යෝජනා ක්‍රමය | ප්‍රතිපාදන වටිනාකම | වෙක්පත් වටිනාකම | ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| **1** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගෙලිඔය, හඬඇල්විය දකුණ සිරි විජිත විහාරස්ථානය සංවර්ධනය කිරීම. | 513,000.00 | | **100%** |
| **2** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සූරියගොඩ ඓතිහාසික ශ්‍රී නරේන්ද්‍රාරාම විහාරස්ථානය සංවර්ධනය කිරීම | 276,295.20 | | **100%** |
| **3** | විදේශ කටයුතු අමාත්‍යාංශය | නේපාලය දුටු ගැමුණු විශ්‍රාම ශාලාව අළුත්වැඩියා කිරීම. | 19,775,952.00 | | **100%** |
| **4** | බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් | මහානායක චාරිකාරාම නිල නිවාසය අළුත්වැඩියා කිරීම. | 5,447,988.75 | | |
| **5** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වැවුරුකන්නල පූජා භූමිය පූජාභූමි සංවර්ධන ව්‍යපෘතියේ යෝජිත කඩකාමර ඉදිකිරීම සඳහා | 2,856,166.99 | | **100%** |
| **6** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | දෙහිඅත්තකණ්ඩිය කැලේගම ශ්‍රී සම්බෝධි විහාරස්ථානය, අම්පාර සංඝාරාමය සහිත පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම. | 2,000,000.00 | | **100%** |
| **7** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | නාකුළුගමුව ශ්‍රී ශෛතලාරාමය සංඝාවාසය ප්‍රතිසංස්කරණය කිරීම | 400,000.00 | | **100%** |
| **8** | විදේශ කටයුතු අමාත්‍යාංශය | අස්ගිරි මහා නායක ස්වාමීන් වහන්සේගේ ආදාහන කටයුතු | 2,247,369.00 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **9** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කළුතර බොඹුවල ශ්‍රී සුබෝධිරාජාරාමය සංඝාවාස ගොඩනැගිල්ල ඉදි කිරීම | 1,500,000.00 | | **100%** |
| **10** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ඓතිහාසික දිඹුලාගල ආරණ්‍ය සේනාසනය සංවර්ධනය කිරීම | 1,000,000.00 | | **100%** |
| **11** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සිතුල්පව්ව රජමහා විහාරස්ථානය හා තිස්සමහාරාම විහාරස්ථානය 2015 රාජ්‍ය උත්සවය වෙනුවෙන් වැසිකිළි 10 ක් ඉදිකිරිම | 3,001,659.00 | | **100%** |
| **12** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | නුගේගොඩ, පාගොඩ විද්‍යාවිජය ආරාමය භාවනා මධ්‍යස්ථානය හා දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරිම | 5,000,000.00 | | **100%** |
| **13** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බුද්ධංගල ආරණ්‍ය සේනාසනය පොසොන් උත්සවය වෙනුවෙන් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු | 500,000.00 | | **100%** |
| **14** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ගල්මුරුව ශ්‍රී සුනන්දාරාම පිරිවෙන් විහාරය සංවර්ධනය කටයුතු | 400,000.00 | | **100%** |
| **15** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | විද්‍යාවාස පිරිවෙණ, විනිඹළුව සංවර්ධනය කටයුතු | 400,000.00 | | **100%** |
| **16** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වල්බෝතලේ පුරාණ පොත්ගුල් විහාරය සංවර්ධනය කටයුතු | 400,000.00 | | **100%** |
| **17** | දිස්ත්‍රික් ලේකම් | පොකුණුවිට | 2,000,000.00 | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | කාර්යාලය | කිත්සිරිමෙවන් රජමහා විහාරය පියගැටපෙළ ඉදිකිරිම | | | |
| **18** | Sounhikari (pvt) ltd | අතිපූජ්‍ය දවුල්දෙණ ඥාණිස්සර ස්වාමීන් වහන්සේගේ ජන්ම ශත සංවත්සර සැමරුම නිමිත්තෙන් කළ වාර්තා වැඩසටහන | | 1,184,000.00 | |
| **19** | ශ්‍රී ලංකා නාවික හමුදාපති | අස්ගිරි මහා විහාරස්ථානයේ සත්සියවස් පූර්ණය නිමිත්තෙන් සිදුකරන ලබන සංවර්ධන කටයුතු සඳහා | | 35,068,626.37 | **75%** |
| **20** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | තන්තිරිමලේ විහාර පූජාභූමිය පොසොන් උත්සවය වෙනුවෙන් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු | | 500,000.00 | **100%** |
| **21** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රජරට චාරිකා නිවාසය අළුත්වැඩියා කටයුතු | | 8,190,237.34 | |
| **22** | ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | ගැටබරුව රජමහා විහාරස්ථානයේ ධාතු මන්දිරය ඉදිකිරීම | 10,000,000.00 | | |
| **23** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මහනුවර අස්ගිරිය යටවත්ත විහාරස්ථානය තෙමහල් සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරිම | 1,500,000.00 | | **100%** |
| **25** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අවරන්තුලාව චෛතියගිරි රජමහා විහාරය | 578,000.00 | | **100%** |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | වැසිකිළි පද්ධතිය සකස් කිරීම | | | |
| **26** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | කළුවැල්ල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානය ඉදිකෙරෙමින් පවතින ධාතුමන්දිරය හා පුස්තකාලය සහිත ගොඩනැගිල්ලේ ඉතිරි කටයුතු නිම කිරිම සඳහා | 1,500,000.00 | | **100%** |
| **27** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පරමධම්ම විහාරස්ථානය, මොරකැටිය වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 500,000.00 | | **100%** |
| **28** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වේහැල්ල වේළුවනාරාම විහාරස්ථානය ධාතුමන්දිරය, ධර්මශාලාව සහිත ගොඩනැගිල්ලේ ඉදිකිරිම් කටයුතු සඳහා | 1,000,000.00 | | **100%** |
| **29** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මහාමේඝාරාම විහාරස්ථානය, මහරගම ධර්ම මන්දිරයේ වහල් ප්‍රතිසංස්කරණය කිරීම | | 2,000,000.00 | **100%** |
| **30** | නාවික හමුදාපති | යාපනය, නාගදීප රජමහා විහාරස්ථානයේ සංවර්ධනය කටයුතු සඳහා | | 5,119,394.11 | **6% 2016 අගෝස්තු මස වන විට වැඩ අවසන් කරන බව දන්වා ඇත.** |
| **31** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | වැලිගම, අග්‍රබෝධි රජමහා විහාරස්ථානය මුළුතැන්ගෙය සකස් කිරීම | 800,000.00 | | **100%** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **32** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ඓතිහාසික සිත්තම්ගල්ලෙන රජමහා විහාරස්ථානය ඇසළ උත්සවය සඳහා යටිතල පහසුකම් සැපයීම | රු. මිලියන දෙකක් ලබා දී ආපසු පවරාගෙන ගිරිහඬු රජමහා විහාරස්ථානයේ සංවර්ධනය කටයුතු සඳහා ලබා දී ඇත | | ******** |
| **33** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | බුස්ස ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානය දහම් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම් කටයුතු | 1,000,000.00 | | **100%** |
| **34** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | තන්තිරිමලේ විහාර පූජාභූමිය දානශාලාවේ ඉදිකිරීම් කටයුතු වලට අදාලව නොගෙවූ බිල්පත් ගෙවීම | 342,938.00 | | **100%** |
| **35** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | අත්තනගල්ල රජමහා විහාරස්ථානය පිවිසුම් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 3,200,000.00 | | **100%** |
| **36** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | සේරුවිල මංගල රජමහා විහාරය, ත්‍රිකුණාමලය විශ්‍රාම ශාලාව අළුත්වැඩියා කිරීම | 1,000,000.00 | | **100%** |
| **37** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | ශ්‍රී සුමනාරාම විහාරස්ථානය, රත්නපුර ධාතුමන්දිරය ඉදිකිරීම | 952,887.41 | | |
| **38** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | පාහියන්ගල ගල්ලෙන් රජමහා විහාරස්ථානය වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 300,000.00 | | **100%** |
| **39** | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | රංවල පහන දේවාල පූජාභූමිය ධර්මශාලාව ඉදිකිරීම | 1,000,000.00 | | **100%** |
| **40** | ආසිරි කන්ස්ට්‍රක්ෂන් | ගමකන්ද රත්නාලංකාර | | 7,882,390.11 | **100%** |

| | | | | | |
|---|---|---|---|---|---|
| | ආයතනය | පුරාණ විහාරස්ථානයේ සංඝාවාසය ඉදිකිරිම | | | |
| **41** | ද කැන්ඩි පර්නිචස් | අස්ගිරි මහා විහාරස්ථානයට ලී බඩු සැපයීම | | 190,550.00 | **100%** |
| **42** | ප්‍රාදේශිය ලේකම්, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | පාගොඩ විද්‍යාවිජය ආරාමයේ සංවර්ධනය කිරීම | | 500,000.00 | **100%** |
| **43** | ප්‍රාදේශිය ලේකම්, බුලත්සිංහල | පාහියන්ගල ගල්ලෙන් රජමහා විහාරස්ථානයේ එකලා විදුලි සැපයුම තෙකලා විදුලි සැපයුමක් බවට පත් කිරීම | | 331,500.00 | **100%** |
| **44** | ප්‍රාදේශිය ලේකම්, තිස්සමහාරාමය | සිතුල්පව්ව රජමහා විහාරස්ථානයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරිමේ හිඟමුදල් ගෙවිම | | 116,224.00 | **100%** |
| **45** | ආසිරි කන්ස්ට්‍රක්ෂන් ආයතනය | අනුරාධපුර ජයන්ති විහාරස්ථානයේ ඉදිකිරීම | | 3,541,513.83 | **100%** |
| **46** | දැව සංස්ථාව | ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ සංඝ මුලස්ථාන ගොඩනැගිල්ල සඳහා දැව භාණ්ඩ මිළදී ගැනිම | | 4,729,832.10 | **100%** |
| **47** | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට | ගිරිහඬු රජමහා විහාරස්ථානයේ සංවර්ධන කටයුතු | 2,000,000.00 | | 100% |

2015 වර්ෂයේ නිදහස් කර ඇති ප්‍රතිපාදන / චෙක්පත් - පූජාභූමි

**පූජා භූමි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (01)**

**වැය ශිර්ෂය - 101-02-06-2502-1**

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) 2015.12.31 දිනට | ඉතිරිය (රු.මි.) |
|---|---|---|---|
| 2015 | 138 | 111.64 | 6.57 |

# 03. ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන්

## 3.1 පුණ්‍යග්‍රාම වැඩසටහන

### අරමුණ

සදාචාර සම්පන්න ගුණගරුක සමාජයක් බිහිකිරීම උදෙසා දිවයින පුරා පිහිටි විහාරස්ථාන කේන්ද්‍ර කර ගනිමින් ගමත් පන්සලත් එක්කරමින් සාරධර්ම සුරකින සදාචාරාත්මක ගුණගරුක සමාජයක් බිහිකිරීමට ගිහි පැවිදි කණ්ඩායම්වලට තම කාර්යභාරය මැනවින් අවබෝධ කර දී ඒ හරහා සමාජයේ වැදගත් පිරිස වන තරුණ පරපුර රටේ ආර්ථික මෙන්ම සාමාජයීය හා ආධ්‍යාත්මික සංවර්ධනය උදෙසා යොදා ගැනීමට අවශ්‍ය මාර්ගය පෙන්වා දීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

### ක්‍රියාත්මක ක්‍රමවේදය

මෙම ව්‍යාපෘතියේ දී පුණ්‍යග්‍රාම වැඩසටහනට සහභාගී කර ගනු ලබන විහාරස්ථාන වල සංවර්ධන කාර්යයන් උදෙසා ද ආධාර ලබා දෙනු ලබයි. මෙම වැඩමුළුව මඟින් දහම්පාසල් දරුවන් සඳහා පොත් බෙදා දීම, දහම්පාසල් දරුවන්ගේ කුසලතා ඇගයීම, ඒ වෙනුවෙන් ත්‍යාග, සහතිකපත්, තිළිණපත් ලබා දීම සිදු කෙරේ. විහාරස්ථාන තෝරා ගැනීම ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත සිදු කරනු ලබයි. 2015 වර්ෂයේ පුණ්‍යග්‍රාම වැඩසටහන් 04 ක් පවත්වන ලදි.

### මූල්‍යමය ආධාර ස්වභාවය

ආධාර ලබාදීමේ දී ප්‍රධාන විහාරස්ථානයක් සඳහා රුපියල් 150,000.00 ක ආධාර මුදලක් ලබා දීම සිදු කරනු ලබයි.

### වියදම් ස්වභාවය

පුණ්‍යග්‍රාම වැඩසටහන සඳහා පුනරාවර්තන වියදම් වෙනුවෙන් 2015 වර්ෂයට වෙන් වූ මුදල රුපියල් මිලියන 27.5 කි. 2015.12.31 දින වන විට මුළු මුදලම වියදම් කර ඇත. එමෙන්ම ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 19.55 ක් වෙන් වූ අතර 2015.12.31 දින වන විට මුළු මුදලම වියදම් කර ඇත.

2015 වර්ෂයේ දී දිස්ත්‍රික් මට්මින් පුණ්‍යග්‍රාම වැඩසටහන සඳහා විහාරස්ථාන ආධාර ලබා දීම.

| අනු අංකය | දිස්ත්‍රික්කය | වැඩසටහන් සංඛ්‍යාව | ආවරණය වූ විහාරස්ථාන සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රත්නපුරය | 18 | 54 |
| 02 | ගාල්ල | 20 | 60 |
| 03 | මාතර | 44 | 132 |
| 04 | හම්බන්තොට | 37 | 111 |
| එකතුව | | **119** | **357** |

## පුණ්‍යග්‍රාම වැඩසටහන

| වැය ශීර්ෂය | 101-01-02-1405-2 |
|---|---|
| වැඩසටහන් ආරම්භය | 2004 |
| අමාත්‍ය මණ්ඩල තීරණය | ව්‍යාපෘති වාර්තාව 2004 වර්ෂයේදී අනුමත කර ගෙන ඇත. ඒ අනුව වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් වී ඇත. |
| අරමුණු | සාරධර්ම සපිරි ගුණගරුක සමාජයක් බිහිකිරීම උදෙසා ගමයි පන්සලයි එක් කරමින් විහාරස්ථාන කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියකි. |
| කාලසීමාව | වාර්ෂික වැඩ සටහනකි. |

## මුදල් ප්‍රතිපාදන ලැබීම් හා වියදම් සාරාංශය 2004 -2015 දක්වා

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| **2004 -2013 දක්වා** | **75.50** | **67.90** |
| **2014** | **38.00** | **38.00** |
| **2015** | **27.00** | **24.89** |
| එකතුව | **140.50** | **129.98** |

| ප්‍රතිපාදන (රු.මි) | 2015.12.31 දිනට වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | ප්‍රගතිය (%) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 27.00 | 24.89 | 2.11 | 92.2% | ❖ ගම්පහ දිස්ත්‍රික් මූලික දැනුවත් කිරීමේ වැඩසටහන 2015.12.17 පවත්වන ලදි. ❖ කෑගල්ල දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 24 ක සංවර්ධන කටයුතු සඳහා රු.මි.3.6 ක ආධාර මුදල් ලබා දී ඇත. ❖ කෑගල්ල දිස්ත්‍රික්කයේ පුණ්‍යග්‍රාම ප්‍රාදේශීය කමිටු පිළිබඳ තොරතුරු ආකෘති පත්‍ර ලැබී ඇත. ගම්පහ දිස්ත්‍රික්කයේ විහාරස්ථාන 36ක සංවර්ධන කටයුතු සඳහා රු.මි.5.4 ක ආධාර මුදල් ලබා දී ඇත. ❖ දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි වැඩසටහන් 18ක් මඟින් පුණ්‍යග්‍රාම සඳහා තොරතුරු ඇතුලත් කිරීම පිළිබඳව සියලුම බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් දැනුවත් කිරීම. |

## 3.2 මතට තිත ව්‍යාපෘතිය

### අරමුණ

මතට තිත ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ වැඩපිළිවෙල සාර්ථකව ක්‍රියාත්මක කරමින් ජනතාවට මත්ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන හානිය අවම කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ජනතාව තුළ ඇති හැකියාව වැඩි දියුණු කරමින්, සංවර්ධිත රටක් තුල සාරධර්ම සුරකින සතුටින් පිරි ජනතාවක් සහිත දේශයක් ගොඩනගා ගැනීම මෙහි ප්‍රධාන අරමුණ වේ.



### ක්‍රියාත්මක ක්‍රමවේදය

මද්‍යසාර, දුම්කොළ ඇතුළු මත්ද්‍රව්‍ය භාවිතය ක්‍රමානුකූලව අඩුකිරීම, ඒවා භාවිතයෙන් සිදුවන හානිය අවම කිරීම හා නීති විරෝධී මත්ද්‍රව්‍ය සම්පූර්ණයෙන් තුරන් කිරීම මඟින් සියලු ශ්‍රී ලාංකිකයින්ගේ සෞඛ්‍ය හා යහපැවැත්ම දියුණු කිරීමත්, නිෂ්පාදන ඵලදායීතාවය වැඩි කිරීමත්, දිළිඳුකම පිටු දැකීමත් සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් සිදුවන සෘජු හා වක්‍ර හානිය පිළිබඳව නිවැරදිව ජනතාව දැනුවත් කිරීම.

### වියදම් ස්වභාවය

2015 වර්ෂයට රුපියල් මිලියන 11.0 ක ප්‍රතිපාදන වෙන් වූ අතර, ඒ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

## මතට තිත ව්‍යාපෘතිය

| වැය ශීර්ෂය | 101-01-06-2502-10 |
|---|---|
| වැඩසටහන් ආරම්භය | 2007 වර්ෂයේ සිට වාර්ෂිකව |
| අමාත්‍ය මණ්ඩල තීරණය | 2006 |
| අරමුණු | ජනතාවට මත් ද්‍රව්‍ය භාවිතය නිසා සිදුවන හානිය අවම කර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට ජනතාව තුළ ඇති හැකියාව වැඩි දියුණු කරමින් සාරධර්ම සුරකින සතුටින් පිරි ජනතාවක් සහිත රටක් බිහි කිරීම. |
| කාලසීමාව | වසරක් පාසා ක්‍රියාත්මක වේ. |

**මුදල් ප්‍රතිපාදන ලැබීම් හා වියදම් සාරාංශය 2007 – 2015 දක්වා**

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි) | වියදම් (රු.මි) |
|---|---|---|
| 2007- 2012 දක්වා | 106.00 | 43.00 |
| 2013 | 10.00 | 10.00 |
| 2014 | 11.00 | 11.00 |
| 2015 | 11.00 | 9.84 |
| **එකතුව** | **138.00** | **73.84** |

# 3.3 වෙනත් භාෂා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

## හැඳින්වීම

බුදු දහමේ දිගු කාලීන චිරස්ථිතිය සහ පැවැත්ම සඳහා වර්තමාන සමාජය තුළ විවිධ භාෂාවන් පිළිබඳ භික්ෂූන් වහන්සේලා සතු දැනුම, අවබෝධය හා ප්‍රායෝගික භාවිතය ඉතා වැදගත් වේ. ඒ වෙනුවෙන් මෙරට වාසය කරන බෞද්ධ, හින්දු මෙන්ම ලොව බුදුදහම පවතින රටවල්වල ජනතාව වෙනුවෙන් ධර්ම ඥාණය පැතිරවීම සඳහා දෙමළ, ඉංග්‍රීසි, පාලි, සංස්කෘත භාෂා ඉගැන්වීමටත් භික්ෂූන් වහන්සේලා සතු භාෂා ඥාණය පුළුල් කිරීම සඳහාත් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

## අරමුණ

භික්ෂූන් වහන්සේලාට ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා භාෂා හැකියාවන් වර්ධනය කිරීම හා විධිමත් භාෂා ඥාණයක් ලබා දීම.

## ක්‍රියාත්මක ක්‍රමවේදය

අනුරාධපුර භික්ෂු විශ්ව විද්‍යාලය, අගලවත්ත ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය, කෑගල්ල සණස අධ්‍යාපන මණ්ඩපය යන මධ්‍යස්ථාන කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙය නේවාසික පුහුණු වැඩසටහනක් වේ.

## වියදම් ස්වභාවය

2015 වර්ෂය සඳහා රුපියල් මිලියන 2 ක ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, ඒ අනුව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

| වැය ශීර්ෂය | 101-02-06-2502-13 |
|---|---|
| වැඩසටහන් ආරම්භය | 2007 වර්ෂය |
| අරමුණු | භික්ෂූන් වහන්සේලාට වෙනත් භෂාවන්ගෙන් ධර්මය දේශනා කිරීම සඳහා විධිමත් භාෂා ඥාණයක් ලබා දීම. |
| | ආගම් අතර අන්‍යොන්‍ය සහජීවනය ඇතිවන අයුරින් වැඩසටහන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම. |

**මුදල් ප්‍රතිපාදන ලැබීම් හා වියදම් සාරාංශය 2014 - 2015 දක්වා**

| වර්ෂය | ලැබුණු ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|
| 2014 | 4.00 | 0.16 |
| 2015 | 6.00 | 3.54 |
| එකතුව | 10.00 | 3.70 |

**වෙනත් භාෂා ප්‍රවර්ධනය කිරීම හා ආගමික සහජීවන වැඩසටහන**

| ප්‍රතිපාදන (රු.මි) | 2015.12.31 දිනට වියදම (රු.මි) | ඉතිරිය (රු.මි) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|
| 6.00 | 3.54 | 2.46 | 59% |

කෑගල්ල දිස්ත්‍රික් දෙමළ භාෂා සහතික පත්‍ර පාඨමාලාව හා දෙමළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා වියදම් ලබා දී ඇත

## 04.බුද්ධශාසන අරමුදල

## 04.1 අනුමත ව්‍යාපෘති සඳහා වූ වාර්තමාන ප්‍රගතිය

| | |
|---|---|
| 1. සාමනේර ආයතන වලට මුල්‍යාධාර ලබා දීම | 1,542,500.00 |
| 2. සාමනේර කැපකරු (විශේෂ ) දායක ක්‍රමය | 2,572,900.00 |
| 3. ස්ථාවර තැම්පත් ආයෝජන | 21,000,000.00 |
| 4. බාහිර ආයතන වලට ගෙවීම් සඳහා කළ පරිත්‍යාග | 16,396,076.97 |
| 5. වැඩිහිටි වියේදී පැවිදි වූ භික්ෂුන් වහන්සේලාගේ පුහුණු වැඩසටහන | 226,998.00 |
| 6. සාමණේර හිමිවරුන්ගේ විභාග වියදම් | 385,370.00 |
| **එකතුව** | **42,123,844.97** |

**<u>සාමණේර ශිෂ්‍යාධාර (කැපකරු දායක) ක්‍රමය ක්‍රියාත්මක කිරීම (විශේෂ)</u>**

2600 සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් ආරම්භ කරන ලද මෙම වැඩසටහනේ අනුමත ඉලක්කට සාමණේර භික්ෂුන් වහන්සේලා 1500කි. දැනට 618 නමක් හිමිවරුන්ට කැපකරු ක්‍රමය යටතේ මාසිකව රු.500/= බැගින් මූල්‍යාධාර ලබා දීම සිදු කෙරේ. සම්බුද්ධ ජයන්ති කැපකරු දැයක ක්‍රමය යටතේ හා 2014 වර්ෂයේ සිට ක්‍රියාත්මක කැපකරු ශිෂ්‍යාධාර ක්‍රමය යටතේ භික්ෂුන් වහන්සේලා සඳහා ශිෂ්‍යාධාර ලබාදීම සිදු කෙරේ. 2015 වර්ෂයේ දෙසැම්බර් 31 වන විට සාමණේර කැපකරු ශිෂ්‍යාධාර වශයෙන් රු. 2,572,900ලබා දී ඇත.

**<u>සාමණේර ආයතන ලියාපදිංචි කිරීම</u>**

දැනට ලියාපදිංචි සාමණේර ආයතන සංඛ්‍යාව 18කි. තවත් සාමණේර ආයතන ලියාපදිංචි කිරීමට අදාල තොරතුරු රුස්කිරිම නොකඩවා ක්‍රියාත්මකය. සෑම වර්ෂයකම දෙසැම්බර් මස 25 වන දින සාමණේර ආයතන සමාප්ති විභාගය පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේදී පවත්වනු ලැබේ. 2015 වර්ෂයට සාමණේර ආයතන සඳහා මූල්‍යාධාර වශයෙන් රු. 1,542,500 ගෙවීම් කර ඇත.

**<u>වැඩිහිටි වියේදී පැවිදි භාවයට පත් වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතයට අයත් වත් පිළිවෙත් පිළිබඳ අවබෝධය හා දහම් දැනුම් වර්ධනය කිරීමේ වැඩසටහන</u>**

ඉහත වැඩසටහන මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර තලගුණේ බෙත්තාරාම පුරාණ විහාරස්ථානයේදී 2015 දෙසැම්බර් 04, 05 සහ 06 වන දිනයන්හිදී පැවැත්විණි.

මෙහි මීලඟ වැඩසටහන පුත්තලම දිස්ත්‍රික්කට පාදක කරගෙන පැවැත්වීම සඳහා කටයුතු සූදානම් කරමින් පවතී

## බුද්ධශාසන අරමුදල සඳහා රාජ්‍ය අංශයේ, අර්ධ රාජ්‍ය අංශයේ, අර්ධ රාජ්‍ය අංශයේ සහ පළාත් සභාවන්හි සේවා නියුක්තිකයන්ගේ දායකත්වය ලබා ගැනීම.

බුද්ධශාසන අරමුදලට ශාසනික උන්නතිය වෙනුවෙන් රාජ්‍ය සේවකයන්ගෙන් දායකත්වය ලබා ගැනීමේ අභිලාෂයෙන් යෝජිත ඉහත ව්‍යාපෘතිය සඳහා 2015.04.01 දින පැවති 73 වන පාලක මණ්ඩල රැස්වීමේදී අනුමැතිය හිමි විය. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවමින් කරමින් පවතී. දැනට මෙම ව්‍යාපෘතිය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ එකඟතාවය ඉල්ලා ඇත.

## භික්ෂු වෛද්‍යාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

වයෝවෘද්ධ භාවයට පත්ව ගිලන්වන හෝ ගිලන්ව අසරණ තත්වයට පත්වන භික්ෂූන් වහන්සේලා සඳහා වෛද්‍ය පහසුකම් ලබා ගැනීම සඳහා උපකාරයක් ලෙස මාසිකව රු.5000/= දීමනාවක් ලබාදීම සඳහා 74 වැනි පාලක මණ්ඩලය මගින් රුපියල් මිලියන 15 ක් ආයෝජනය කිරිමටත් එම පොලියෙන් දීමනා ගෙවීමත් අනුමත කර ඇත. මේ යටතේ 2015 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු මාස සඳහා ස්වාමීන් වහන්සේලා දෙනමක් සඳහා වෛද්‍යාධාර දීමනා ලෙස රු.40000/= ගෙවා ඇත.

## බෞද්ධ ධර්ම ග්‍රන්ථ මුද්‍රණය.

2015 වර්ෂව තුළ නැදිමාල බෞද්ධ සංස්කෘතික මධස්ථානය හා බුද්ධශාසන අරමුදල එක්ව ධර්ම ග්‍රන්ථ මුද්‍රණය සඳහා ගිවිසුම් තුනකට එළඹ ඇත.

## පාලි අට්ඨ කථා පොත් සිංහලට පරිවර්තනය, මුද්‍රණය හා විකිණීම.

මේ යටතේ ග්‍රන්ථ 38 ක් එකකින් 1000 බැගින් මුද්‍රණය කරන අතර මෙයින් 100 බැඟින් බෞද්ධ සංස්කෘතික මධස්ථානයට පරිත්‍යාග කෙරේ. 100 බැගින් අරමුදලට ලබා දිය යුතු අතර එම ප්‍රමාණය ලබා දී ඇත. ගිවිසුම්ගත ඇස්මේන්තු පිරිවැය 14,044,000/= (රු.මි.14.04) කි. බූද්ධ ශාසන අරමුදල මඟින් මෙම වියදම් දරා ඇත. මේ වන විට බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය විසින් විකුණන ලද පොත් වෙනුවෙන් බුද්ධශාසන අරමුදලට ලබා දිය යුතු මුදල රු. 7,988,635.88ක් (රු.මි7.88) වන අතර එම ආයතනයේ විකිණීමට ඇති පොත්වල වටිනාකම රු.3,127,962.74කි.(රු.මි 3.13)

## පාලි ටීකා සිංහල පරිවර්තනය

මේ යටතේ ග්‍රන්ථ 11 ක් 1000 ක් බැගින් මුද්‍රණය කිරීමටත් එයින්100 ක් බැගින් බෞද්ධ සංස්කෘත මධ්‍යස්ථානට ලබා දීමටත් ඉතිරි 900 බැගින් අරමුදල වෙත් ලබාදීමට කටයුතු කළ යුතුව තිබිණි. මෙම ව්‍යාපෘතියට අයත් ග්‍රන්ථ 8139 ක් අරමුදල විසින් භාරගෙන ඇති අතර බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයට

මෙම ව්‍යාපෘති වෙනුවෙන් ගිවිසුම ප්‍රකාරව තවදුරටත් ගෙවිය යුතු මුදල් ගෙවා නිරවුල් කළ යුතුව ඇත. මෙම පාලි ටීකා ග්‍රන්ථ සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කිරීම සඳහා ඇස්තමේන්තුව වියදම රු.12,104,225.00 ක් වන අතර ගෙවා ඇති මුදල රු. 7,489,275.50 (රු.මි. 7.5)කි. ඉතිරි මුදල රු.4,614,949.50 (රු.මි. 4.6) සංස්කෘතික මධ්‍යස්ථානයට ගෙවිය යුතුව ඇත.

**<u>පාලි අට්ඨ කථා ඉංග්‍රීසියට පරිවර්තනය කිරීම</u>**

ගිවිසුම් ප්‍රකාරව පාලි ටීකා ග්‍රන්ථ 12 ක් ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම සඳහා ගිවිසුම් අත්සන් කර ඇත. මින් ග්‍රන්ථ 06ක මුද්‍රණ කටයුතු දැනට අවසන් බවත් ඉතිරි 06 පරිවර්තන කටයුතු අවසන් බවත් බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය විසින් දන්වා ඇත. එසේම මුද්‍රණ කටයුතු අවසන් ග්‍රන්ථ 06 සඳහා ඇස්මේන්තු මුදල රු.3,234,100.00 (රු.මි. 3.23) එසේ වුවත් ඒ සඳහා මිලියන 4 කට වැඩි පිරිවැයන් දැරීමට සිදු වූ බවත් ඉතිරි ග්‍රන්ථ 06 සඳහා ද එසේම වියදම වැඩිවන බවත් දන්වා ඇත. පාලි අට්ඨ කථා ඉංග්‍රීසි පරිවර්තන සඳහා ද එසේම වියදම වැඩිවන බවත් දන්වා ඇත. පාලි අට්ඨ කථා ඉංග්‍රීසි පරිවර්තන සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.721,100.00 (රු.මි.0.72) කි. මෙයින් මේ වන විට අරමුදල විසින් ගෙවා ඇති මුදල රු1,080,165.00කි.

වසර 05 කට ආසන්න කාල සීමාවක් පොත් සුරක්ෂිතව තබා ගැනීමේ ගබඩා පහසුකම් සහ කෘමි උවදුරු වලක්වා ගැනීම සඳහා ඇස්තමේන්තු පිරිවැයට අතිරේකව රු. 1,950,000.00 ක වියදමක දැරීමට සිදු වී ඇති බව බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය විසින් වැඩිදුරටත් දන්වා ඇත.

ව්‍යාපෘති වියදම්වලට අතිරේකව අරමුදල විසින් වැය කරන ලද සියලුම පරිපාලන, ලිපි ද්‍රව්‍ය දීමනා ගමන් වියදම් සඳහා 2016 වර්ෂයේ අප්‍රේල් 30 දක්වා අරමුදල විසින් දරන ලද සම්පූර්ණ පිරිවැය රු 124,629.00කි.